# 3. දේව සැලැස්මට අවනත වූවෝ

**දේව පුත්‍රයාණන් මිනිසත් බව ගෙන උපත ලැබීමත් උන්වහන්සේට පෙරටුව ගොස් එතුමා වඩින මග පිළියෙල කිරීමේ අරමුණින් පැමිණි ස්නාවක ජොහාන්තුමාගේ උපතත් දේව ප්‍රසාදය තුළ දේව සැලැස්මට අනුව සිදු විය. එම සුවිශේෂී උපත් දෙස අවධානය යොමු කිරීමේ දී දේව සැලැස්මට අනුකූල ව සියල්ල සිදු වන ආකාරය මැනවින් අවබෝධ කර ගත හැකි වේ.**

**ශු. ලූක් 1 : 5-56**

කිතු උපත හා ස්නාවක ජොහාන්තුමාගේ උපත පිළිබඳ සුභාරංචිය ප්‍රකාශ කරනු ලැබුවේ "ගාබ්‍රියෙල් දේව දූතයා" විසිනි. ඒ මෙලෙසිනි

**"දෙවියන් වහන්සේ අභිමුවෙහි සේවා කරන ගාබ්‍රියෙල් මම ය.**<br>**මා එවන ලද්දේ ඔබ සමග කථා කරන්නටත්**<br>**මේ සුභාරංචිය ඔබට පවසන්නටත් ය."**<br>**ලූක් 1 : 19**

මෙලෙස මෙම උපත් පිළිබඳ සුභාරංචිය දැනුම් දීම පවා සිදු කරනු ලැබුවේ දේව අභිමතය පරිදි යම් සැලැස්මක් ඇති ව බව පැහැදිලි ය.

එලෙස දේව රාජ්‍ය උදෙසා වූ ස්වාමීන් වහන්සේගේ මෙහෙවරට මග පිළියෙල කරමින් ජනතා හදවත් උන්වහන්සේ වෙතට යොමු කිරීම පිණිස ගාබ්‍රියෙල් දේව දූතයා විසින් ස්නාවක ජොහාන්ගේ උපත පිළිබඳ ව සෙකරියස් වෙත පවසන ලද වදන් වෙත අවධානය යොමු කරමු.

**සෙකරියස් බිය නොවන්න. මන්ද ඔබේ යාච්ඤාව අසනු ලැබී ය.**<br>**ඔබේ බිරිඳ වන එලිසබෙත් ඔබගෙන් පුතකු ලබන්නී ය.**<br>**ඔහුට ජොහාන් යයි නම් තබන්න.**<br>**සතුට සහ සොම්නස ඔබට ඇති වේ.**<br>**බොහෝ දෙන ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නා හ.**<br>**මන්ද ඔහු ස්වාමීන් අභිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය.**<br>**ඔහු මිදියුෂවත් මත්පැන්වත් නොබොන්නේ ය.**<br>**මව් කුස සිට ම ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණ වන්නේ ය.**<br>**ඔහු ඉශ්‍රායෙල්වරු බොහෝ දෙනකු ඔවුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේ වෙත හරවන්නේ ය.**<br>**ඔහු මව්පියන් හා දරුවන් සමගි කරන්නේ ය.**<br>**නොදැමුණු ජනයන් දමිටුන්ගේ ප්‍රඥාවට හරවන පිණිස ද**<br>**සැදී පැහැදී සිටින සෙනඟක් ස්වාමීන් වහන්සේට සූදානම් කර දෙන පිණිස ද**<br>**එලියාගේ ආත්මානුභාවයෙන් හා බලයෙන් උන්වහන්සේට පෙරටුව යන්නේ ය.**<br>**ලූක් 1:13-17**

ඉහත සඳහන් ප්‍රකාශය අනුව දේව සැලැස්මේ අරමුණ ස්නාවක ජොහාන්තුමා තම සේවය තුළින් ඉටු කරනු ලැබී ය. ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණ ව, ජනතාවට මනස්ථාපනයේ බෞතීස්මය ලබා දෙමින් බොහෝ දෙනකු ස්වාමින් වහන්සේ වෙත හරවනු ලැබී ය.

කිතු උපත ශත වර්ෂ ගණනාවක් ජනතා හදවත් තුළ තිබූ බලාපොරොත්තු මල් ඵල ගැන්වීමක් විය. දේව පුත්‍රයාණන් මාංශගත වීමේ සිද්ධිය මෙම උපත තුළින් සම්පූර්ණත්වයට පත් විය.

**ක්‍රිස්තු උපත පිළිබඳ ප්‍රකාශිත අනාවැකි මෙලෙස ය.**

***උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක.***
***පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබන සේක.***
***උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය***
***දෙවි ස්වාමින් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක.***
***උන්වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙ හි***
***සදහට ම රජකම් කරන සේක.***
***උන්වහන්සේගේ රාජ්‍යය කෙලවරක් නොදක්නේ ය.***
***ලූක් 1:32-33***

මෙලෙස දේව රාජ්‍යය උදෙසා ජේසුස් වහන්සේ විසින් සිදු කළ යුතු මෙහෙවර සම්බන්ධ සියල්ල ඉටු වන්නේ දෙවියන් වහන්සේගේ සැලැස්ම හා අනුකූල වෙමිනි. ඒ බව ජේසුස් වහන්සේගේ උපත, සේවය, දුක් විඳීම, මරණය හා උත්ථානය යන සෑම සිද්ධියක් තුළින් ම පැහැදිලි වේ. එලෙස ජේසුස් වහන්සේ පිළිබඳ දිවැසිවරු ප්‍රකාශ කළ අනාවැකි සම්පූර්ණ විය.

ජේසුස් වහන්සේගේ හා ස්නාවක ජොහාන්තුමාගේ උපත්වලට අදාල ව වැදගත් වන්නා වූ පුද්ගල චරිත කීපයකි. සෙකරියස් පූජක තුමා, ජෝසෙප්තුමා මරියතුමිය හා එලිසබෙත්තුමිය ඒ අතර වෙති. උපත් පිළිබඳ සුභාරංචි ලද ඔවුන් දේව හඬට දැක්වූ ප්‍රතිචාර හා ඔවුන් දේව සැලැස්මට අවනත ව ක්‍රියා කළ ආකාරයත් විමසා බලමු.

සෙකරියස් පූජකතුමා දැහැමි බවින් යුත්, දේව අණ පනත් නිසි ලෙස ඉටු කළ පූජකයෙකි. දෙවියන් වහන්සේට ගරු බිය දැක්වූවෙකි. උන්වහන්සේ කෙරෙහි තිබූ අචල විශ්වාසය නිසා ම දිගු කලක් දේව කන්නලව්වේ නිරත වූවෙකි. මහළු බවට පත් වී සිටිය ද සෙකරියස් පූජකතුමා සහ එලිසබෙත්තුමිය ඔවුන්ට දරුවෙක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර ඊට දෙවියන් වහන්සේ ඔවුන්ට පිළිතුරු දුන් සේක. නමුත් දේව මාළිගයේ දී ගාබ්‍රියල් දේව දූතයා පැවසූ සුභාරංචියට සෙකරියස් පූජකතුමා ප්‍රතිචාර දැක්වූයේ අනුමානයෙනි. ඒ නිසා දරුවා ලැබෙන තෙක් සෙකරියස් පූජකතුමාට කථා කළ නොහැකි විය. දේවදූතයා පැවසූ ලෙස සියල්ල එලෙස ම ඉටු විය.

ජෝසෙප්තුමා තුළ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයත්, භක්තියත් නොඅඩුව තිබුණේ ය. දේව සැලැස්ම තේරුම් ගෙන දේව අණට කීකරු වූ ඔහු දේව දූත පණිවුඩයට අවනත විය. මරියාණන් තම බිරිඳ ලෙස තම නිවසට කැඳවාගෙන ගියේ ය. දේව පුත්‍රයාගේ මව් වීමට නියමිත වූ ඇය සෙනෙහසින් රැක බලා ගත්තේ ය.

මෙලෙස සෙකරියස් පූජකතුමාත්, ජෝසෙප්තුමාත් ලද දේව දූත පණිවුඩය එකිනෙකා භාර ගත් ආකාරයේ වෙනසක් දක්නට ලැබුණ ද ඔවුන් කිසි විටෙකත් දේව සැලැස්මට පිටු නො පෑහ. දේව සැලැස්ම හඳුනා ගෙන දේව අණට අවනත ව ක්‍රියා කළහ.

මරියතුමිය හා එලිසබෙත්තුමියගේ චරිත ද ගැළවුම්කරුවාණන්ගේ උපතට අදාල ව සුවිශේෂී වේ. වයස් ගතව එහෙත් දරුවන් නොමැති ව සිටි එලිසබෙත්ට එයින් නිදහස් වීමට දෙවියන් වහන්සේ අවස්ථාවක් උදා කර දුන් සේක. දීර්ඝ කාලයක් තුළ දෙවියන් වහන්සේට කන්නලව් කරමින් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සහ බලාපොරොත්තුවෙන් සිටි ඇයට දේව ක්‍රියාකාරිත්වයේ ප්‍රබලතාවය අත් විඳින්නට සැලැස්වූ සේක. කාලය හෝ වයස දේව සැලැස්ම ඉටු කිරිමට බාධාවන් නොවන බව මෙය පසක් කර දේ.

දේව සැලැස්මේ විශ්මිත බව අවබෝධ කර ගැනිමට මරිය තුමිය කටයුතු කළ ආකාරය වැදගත් වේ. මේ නිසා වනිතාවන් අතර සමාජය තුළ ගෞරවාදරයටත් පිළිගැන්වීමක් ඇති කිරීමටත් ඇයට හැකි විය.

දේව පණිවුඩය පිළිබඳ පැහැදිලි කළ ගාබ්‍රියෙල් දේව දූතයා
" **මක්නිසාද දෙවියන් වහන්සේට නොකල හැකි කිසිවක් නැත**"
යන්න ප්‍රකාශ කල විට මරියතුමිය බැහැපත් ව
"**බලන්න මම ස්වාමි වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස මට ඉටුවේවා.**" යි
කියමින් ඊට අවනත විය.

දේව කැමැත්තට කීකරු ව එය ඉටු කිරීමට පරිත්‍යාගි ව ඇය කැප වූවාය. දේව පුත්‍රයාණන් මෙලොවට බිහි කිරිම සඳහා තමා ව තෝරා ගැනිම පිළිබඳ ව මරියතුමිය නිහතමානි ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළාය. මේ සියල්ල ඉටු කරමින් ඇය දේව කැමැත්තට හිස නැමුවාය.

ටික කලකට පසු මරියතුමිය තම ඥාති සොයුරිය වු එලිසබෙත් බැහැ දැකීමට පැමිණි අවස්ථාවේ දී එලිසබෙත් විසින් ශුද්ධාත්මයෙන් පූර්ණ ව ඇය පිළි ගනු ලැබුවේ

" **ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දි ය.**"
"**මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන්**" ලෙස ය.

මේ අනුව බලන කළ දේව සැලැස්ම තුළ ක්‍රියා කාරී වීමට අපව ද කැඳවන බව පැහැදිළි ය. ඒ සඳහා නිසි ප්‍රතිචාර දැක්වීමට අප සුදානම් විය යුතුය.

තම කම නසා මරියතුමිය දේව කැමැත්තට අවනත වුවාක් මෙන් අප ද දේව ආරාධනයට අවනත වීම අවශ්‍ය වේ.

ක්‍රියාකාරකම:

1. සෙකරියස් පූජකතුමා, ජෝසෙප්තුමා, මරියතුමිය හා එලිසබත්තුමිය යන මේ එකිනෙකා
   දේව හඬට දැක් වූ ප්‍රතිචාර,
   දේව සැලැස්මට අවනත ව ක්‍රියා කල ආකාරය තුළ දක්නට
   ලැබෙන සමාන අසමාන කම් පැහැදිලි කරන්න.